65. රසයෙහි ගිජුබව නො කරණුයේ රසවිසාහි ලොල් නොවූයේ, අනෙකක්හු නො පුස්නාසුලුයේ, ගෙපිළිවෙළින් පිඬුසිඟා වඩනුයේ (කෙලෙස් විසින්) කුලයෙහි නොලැගි සිත් ඇතියේ කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

66. චිත්තයට ආවරණ වූ පඤ්චනීවරණයන් හැරපියා (අභිධ්‍යාදි) හැම උපක්ලේශයන් විවසුන්-මගින් දුරු කොට (දෘෂ්ටිනිඃශ්‍රයෙන්) අෘනිශ්‍රිත වූයේ (ත්‍රෛධාතුකවූ) සෘහාභද්‍දෙෂය සිඳපියා, කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

67. කායික වූ සුඛය ද දුඃඛය ද පිටු දක පළමු මැ චෛතසික සොම්නස්, දෙම්නස් ද හැරපියා චතුර්ථධ්‍යාන උපේක්ෂාව ද (පඤ්ච-නීවරණයෙන්) විශුද්ධ වූ චිත්තශමථය ද ලැබ, කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

68. පරමාර්ථ (නිර්වාණ) යට පැමිණීම සඳහා රුකුළු වැර ඇතියේ නො හැකුළුනු සිත් ඇතියේ ප්‍රධන්වීර්‍ය ඇතියේ සථිර වූ ඥනබලයට පැමිණියේ කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

69. (කායවිවෙක සඞ්ඛ්‍යාත) පිළිසලන ද (චිත්තවිවෙක සඞ්ඛ්‍යාත) ධ්‍යානය ද නොහරනුයේ, නිරතුරු (විදර්ශනොපග වූ) පඤ්චස්කන්ධාදි ධර්මයන්හි අනුධර්මචාරී වූයේ. භවත්‍රයෙහි ආදීනව දක්නේ කගවෙහෙණ හඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

70. තෘෂ්ණාක්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණය පතනුයේ නොපමා වූයේ කෙළතොලු නොවූයේ ආගමධර වූයේ, සමාතිමත් වූයේ (ධර්මොප-පරීක්ෂායෙන්) පරිඥත ධර්ම ඇතියේ, අරිමගින නියාමයට පැමිණියේ සම්‍යක්ප්‍රධන්වීර්‍ය ඇතියේ, කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

71. ශබ්දයෙහි කේශරසිංහයකු සෙයින් (අනිත්‍යාදියෙහි) ත්‍රාස නො වනුයේ දැලෙහි වාතය සෙයින් (ස්කන්ධධාත්වායතනාදියෙහි) නො ලැගෙනු යේ ජලය හා නො මුසුවන පියුමක් සෙයින් සර්වභවභොගලොභයෙන් නො තැවැරෙනුයේ කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.



Free Distribution  www.aathaapi.org

